www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# සමාජවාදී සමානතා පක්ෂයේ මැතිවරන ප්‍රකාශය

# -ශ්‍රී ලංකාවේ මැතිවරනය තුල සමාජවාදී විකල්පය

***Socialist Equality Party election statement***

**The Socialist alternative in the Sri Lankan elections**

**සමාජවාදී සමානතා පක්ෂය විසිනි**

**2004 මාර්තු 19**

සමාජවාදී සමානතා පක්ෂය (සසප), අප්‍රේල් 2 දා පැවැත්වෙන මහ මැතිවරනයේ දී සමාජවාදී විකල්පයක් සඳහා ගෙන යන උද්ඝෝෂනයට ඒකාබද්ධ වන ලෙස, කම්කරුවන්ගෙන්, තරුනයන්ගෙන් සහ බුද්ධිමතුන්ගෙන් මෙන්ම අපගේ සියලු ම ආධාරකරුවන්ගෙන් හා *ලෝක සමාජවාදී වෙබ් අඩවියේ* පාඨකයන්ගෙන් ඉල්ලා සිටී.

වැඩ කරන ජනතාවගේ අවශ්‍යතා ආරක්ෂා කරනු සඳහාත් යුද්ධයට හා සමාජ ප්‍රතිගාමිත්වයට එරෙහිව ප්‍රජාතන්ත්‍රවාදී හා සමාජවාදී ක්‍රියාමාර්ගයක් ඉදිරිපත් කිරීම සඳහාත්, සසප, කොළඹ දිස්ත්‍රික්කයට අපේක්ෂකයන් 23ක ලැයිස්තුවක් ඉදිරිපත් කරමින් තරග වදී. සසප අපේක්ෂක කන්ඩායමට නායකත්වය දෙන්නේ, පක්ෂයේ ප්‍රධාන ලේකම් ද *ලෝක සමාජවාදී වෙබ් අඩවියේ* ජාත්‍යන්තර කර්තෘ මන්ඩලයේ සාමාජිකයකු ද වන, 63 හැවිරිදි, විජේ ඩයස් ය. සෙසු අපේක්ෂකයන් අතර කම්හල් කම්කරුවන්, ගුරුවරුන් හා ශිෂ්‍යයෝ සිටිති. ඔවුහු සියල්ලෝ ම, කම්කරුවන්ගේ හා පීඩිත ජනතාවගේ ප්‍රජාතන්ත්‍ර හා සමාජ අයිතීන් උදෙසා සටන් කිරීමේ ප්‍රතිපත්තිගරුක වාර්තාවක් දරා සිටිති.

සසප උද්ඝෝෂනයට, දිවයිනේ දේශසීමා ඉක්මවා යන අර්ථභාරයක් පවතී. ආසියාව, ලතින් ඇමරිකාව හා අප්‍රිකාව පුරා දශ ලක්ෂ සංඛ්‍යාත කම්කරුවන්, නව ආකාරයේ ධනේශ්වර සූරාකෑමේ ගොදුරු ලෙස, ධනපති භූගෝලීය නිෂ්පාදන ක්‍රියාදාමයට ඒකාග්‍ර කරනු ලැබ ඇත. එහෙත් ශ්‍රී ලංකාවේ කම්කරුවන් මෙන්ම, ඔවුහු, ඔවුන්ගේ පැරනි නායකත්වයන් හා පක්ෂ මගින් අත්හැර දමනු ලැබ සිටිති. මෙම සංවිධානවල පාවාදීම් මුල්බැස ඇත්තේ, හුදෙක් එක් එක් නායකයන්ගේ දූෂන හා බියගුලුකම තුල නොව, ඔවුන්ගේ ජාතිකවාදී ක්‍රියාමාර්ග තුල ය. ජාතික රාජ්‍ය පද්ධතියට ගැටගැසී ඇති, ඔවුහු සියල්ලෝ ම, ප්‍රජාතන්ත්‍ර අයිතීන් හා සමාජ කොන්දේසි විනාශ කරමින් එල්ල කෙරී ගෙන යන ප්‍රහාර සමග සහයෝගී වෙමින් සහ අධිරාජ්‍යවාදී ආක්‍රමනයට හා යුද්ධයට එරෙහි මොන යම් හෝ අරගලයකට විරුද්ධ වෙමින්. "වෙළඳ පොල ප්‍රතිසංස්කරන" හා "ආර්ථික ප්‍රතිව්‍යුහකරන" පිලිවෙත් ක්‍රියාවට දැමීමෙහි ලා "තමන්ගේ ම" ආන්ඩු සමග එක්වී සිටිති.

ඊට ප්‍රතිකූලව, සසප ඉදිරිදර්ශනයේ හරි මැද පවතින්නේ, ජාත්‍යන්තරවාදය සඳහා අරගලයයි. අපගේ උද්ඝෝෂනය මගින්, අප ප්‍රයත්න දරන්නේ, ශ්‍රී ලංකාවේ හා ආසියාවේ කම්කරුවන් ඇමරිකාවේ, යුරෝපයේ හා ලෝකය පුරා ඔවුන්ගේ පන්ති සහෝදර සහෝදරියන් සමග ඒකාබද්ධ කරමින්, අධිරාජ්‍යවාදයට එරෙහිව භූගෝලීය ප්‍රතිප්‍රහාරයක් වර්ධනය කිරීමටයි.

මෙම මැතිවරනය නිශ්චිත සන්ධිස්ථානයක් සලකුනු කරයි. එය ගෙනඑනු ලැබුවේ, ඡන්දයෙන් තේරී පත්වූ අගමැති රනිල් වික්‍රමසිංහගේ එක්සත් ජාතික පෙරමුනු (එජාපෙ) ආන්ඩුව, බලයෙන් පහ කරනු පිනිස, සිය ආඥාදායක විධායක බලතල යොදා ගනිමින්, ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග විසින් ක්‍රියාවට දැමුනු ව්‍යවස්ථා කුමන්ත්‍රනයක ප්‍රතිඵලයක් ලෙස ය. එහෙත්, ජනාධිපතිගේ ක්‍රියාවේ ප්‍රජාතන්ත්‍ර විරෝධී ස්වභාවය හෙලා දකිනු පිනිස, වික්‍රමසිංහ මත් ඇතුලත් වන පාලක කවයන් තුලින්, එකදු විරෝධතාවක් වත් මතුවී නැත. මෙය, කුමන පක්ෂයක් බලයට පැමිනියත්, ඔවුන් පාර්ලිමේන්තුවම අභිභවා යන පාලන රූපයන්ගේ පිහිට සෙවීමට වඩවඩාත් යොමු වනු ඇත යන්න පිලිබඳව, ශ්‍රී ලංකාවේ මහජනතාව වෙත කෙරුනු තියුනු අනතුරු ඇඟවීමක් ලෙස ගත යුතු ය. වඩ වඩාත් පැහැදිලි වන කාරනාව නම්, ප්‍රජාතන්ත්‍ර අයිතීන්ගේ ආරක්ෂාව සඳහා, පාලක කවයන් තුල, මොන යම් හෝ මට්ටමක සැලකිය යුතු පදනමක් නොමැති බවයි.

කුමාරතුංග නියෝජනය කරන්නේ, ගැඹුරින්ම මහජන වෛරයට ලක්ව ඇති රටේ සිවිල් යුද්ධය ගෙනයාම තුලින් තමන් ඩැහැගෙන ඇති ආර්ථික හා දේශපාලන වාසි හේතුකොටගෙන, දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය සමග ගෙනයන සාකච්ඡාවන්ට සතුරුව පිහිටා සිටින, මිලිටරියේ හා දේශපාලන සංස්ථාපිතයේ කොටස්වල අවශ්‍යතා ය. එජාපෙ ආන්ඩුවේ "සාම ක්‍රියාදාමයට" එරෙහි ඇයගේ

ජාතිවාදී උද්ඝෝෂනය මගින්, යුද්ධය යලි අවුලුවාලීමේ තර්ජනය මතුකරන දේශපාලන බලවේග ලිහාහැර ඇත. කුමාරතුංගගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (ශ්‍රීලනිප) සිංහල ස්වෝත්තමවාදී ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) සමග එක්සත් ජනතා නිදහස් සන්ධානය (එජනිස) නමින් නිල සන්ධානයක් තනාගෙන ඇති අතර, ෆැසිස්ට්වාදී ජාතික හෙල උරුමයේ බෞද්ධ භික්ෂූහු ද අපේක්ෂකයන් ලෙස ඉදිරිපත් වී සිටිති.

වික්‍රමසිංහගේ ඉදිරිදර්ශනය ද ප්‍රතිගාමීත්වයෙන් ඊට අඩු නො වේ. එජාපෙ "සාම ක්‍රියාදාමය", පුද්ගලීකරනය ද රාජ්‍ය අංශයේ වැඩපිලිවෙලවල් හා සහනාධාර දරුනු ලෙස කප්පාදු කිරීම ද මගින් කම්කරුවන්ගේ, ගොවීන්ගේ, තරුනයන්ගේ හා සෙසු කොටස්වල ජීවනෝපායන් විනාශයට ලක් කර ඇති, "යලි පුබුදමු ශ්‍රී ලංකා" නම් වූ පුලුල් ආර්ථික ප්‍රතිසංස්කරන න්‍යාය පත්‍රය සමග සමීපව බැඳී පවතී. එහි ප්‍රතිඵලයක් ලෙස, වැඩෙන ආන්ඩු විරෝධී වර්ජන හා විරෝධතා රැල්ලක් මගින් එජාපෙ ආන්ඩුව සොලවනු ලැබ ඇති අතර, එම තතු මගින්, දේශපාලන සංස්ථාපිතය පුරා, වර්ධනය වන නොසන්සුන්තාවක් අවුලුවා තිබේ.

මෙම මහජන අසන්තෘප්තිය තමන්ගේම අරමුනු උදෙසා ගසාකෑමේ එල්ලයෙන් යුතුව, එජනිස, වික්‍රමසිංහගේ පිලිවෙත්වල විරුද්ධවාදියකු ලෙස පෙනී සිටී. ඔවුන්ගේ මැතිවරන ප්‍රකාශය, පුද්ගලීකරනයට විරුද්ධ හා රාජ්‍ය අංශය ආරක්ෂා කරන බව කියාපාන, ජනතාවාදී පූව්චානම්වලින් පිරී පවතී. කෙසේ වෙතත්, මෙහි දී අපේ මතකයට නැගෙන්නේ, කුමාරතුංග සහ ශ්‍රීලනිපය, 1994 මැතිවරන උද්ඝෝෂනයේ දී හරියටම මෙවැනිම පොරොන්දු දුන්නත්, බලය ගැනීමෙන් පසුව ඇය කලේ, ආර්ථික ප්‍රතිව්‍යුහකරන වැඩපිලිවෙල වේගවත් කිරීම බවයි. ජවිපෙ සම්බන්ධයෙන් ගත හොත්, විටින් විට, "සමාජවාදී" හා "මාක්ස්වාදී" ලෙස පෙනී සිටියත්, එය, ලාභ ගරන ධනපති ක්‍රමය පවත්වාගෙන යාමටත් ශ්‍රී ලංකාව, භූගෝලීය ප්‍රාග්ධනය සඳහා ලාභ ශ්‍රම වේදිකාවක් බවට පරිවර්තනය කිරීම මගින් චීනය, මැලේසියාව හා ඉන්දියාව සමග සම තත්වයට ගෙනඒමටත් කැපවී සිටී.

ලංකා සමසමාජ පක්ෂය (ලසසප) හා කොමියුනිස්ට් පක්ෂය (කොප) මෙන්ම, නව සමසමාජ පක්ෂය (නසසප) වැනි විවිධ "වාම" සංවිධාන, ඒ ආකාරම වන, අතිශයින්ම විසකුරු ක්‍රියාකලාපයක් ඉටු කරති. ඔවුන්ගේ සමස්ත උද්ඝෝෂනයම යොමු වී පවතින්නේ, ප්‍රධාන ධනපති සන්ධාන දෙකෙන් එකකට සහයෝගය දීම හැර වෙනත් විකල්පයක් නැතැයි කම්කරුවන්ට ඒත්තු ගැන්වීමට ය. ඔවුන් එසේ කරන්නේ, මෙම සන්ධාන ප්‍රජාතන්ත්‍රවාදය අතහැර දමා, ජීවන කොන්දේසිවලට පහර දෙමින්, සිවිල් යුද්ධය යලි ඇරඹීමට තර්ජනය කරන පවා තතු යටතේ ය. නසසප, "අඩු නපුර" ලෙස එජාපෙ පින්තාරු කරන අතර, ලසසප හා කොප, සිය කැමැත්ත එජනිසයට පුද කොට එයට නිල වසයෙන් එක්වී තිබේ.

මැතිවරනයෙන් කුමන පක්ෂයක් ජයගත්තත්, කම්කරු පන්තිය මුහුන දෙන තීරනාත්මක ප්‍රශ්න එකක් වත් නො විසඳෙනු ඇතැයි, සසප අවධාරනය කරයි. එක පක්ෂයක් වත් "අඩු නපුර" නියෝජනය නොකරයි. සාමාන්‍ය වැඩ කරන ජනතාවට ස්වකීය අවශ්‍යතා රැකගැනීම සඳහා වන එකම ක්‍රමය වන්නේ, පාර්ලිමේන්තු දේශපාලනයේ යකඩ සැට්ටයෙන් මුලුමනින්ම බිඳීගෙන, ධනපති පන්තියේ සියලු කන්ඩායම්වලින් සිය ස්වාධීනත්වය තහවුරු කරගැනීම පමනි.

අපගේ උද්ඝෝෂනයේ එල්ලය වන්නේ, ශ්‍රී ලංකා සමාජයේ විප්ලවවාදී පරිවර්තනයක් උදෙසා වන කම්කරුවන්ගේ හා ගම්බද දුගීන්ගේ මහජන ව්‍යාපාරයක් ගොඩනැගීම සඳහා දේශපාලන පදනම් ස්ථාපිත කිරීමයි. එහි කේන්ද්‍රීය යොමුව පවතින්නේ, ඡන්ද දිනාගැනීම නොව, අදහස් හා පිලිවෙත් අරභයා සාකච්ඡාවක් වර්ධනය කරගැනීමටයි. වත්මන් අර්බුදයේ මූල හේතුව, අගමැති වත් ජනාධිපති වත්, ඔවුන් මෙන් ම ප්‍රතිගාමී වන, ඔවුන්ගේ දේශපාලන පක්ෂ වත් නො වේ. එය පවතින්නේ, ලෝක ආර්ථිකය සහ ධනපති ලාභ ගරන ක්‍රමය ම වෙලා ගෙන ඇති අතිමූලික පරස්පර විරෝධතා තුල ය.

## එක්සත් ජනපද මිලිටරිවාදයේ පිපිරීම

අද ලෝක දේශපාලනයේ ප්‍රධාන සාධකය වන්නේ, එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ පුපුරන සුලු පැනනැගීමයි. "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයේ" ධජය යටතේ, වොෂිංටනය, ලෝකයේ ප්‍රධාන මූලෝපායික ප්‍රදේශ මත සිය අනභියෝගී භූගෝලීය ආධිපත්‍යය තහවුරු කරගැනීමේ උත්සාහයක යෙදී සිටී. බුෂ් ආන්ඩුව විවෘත මැරබලය, ආර්ථික හිරකිරීම් සහ ආක්‍රමනික යුද්ධ දෙසට හැරීගැනීම, ශක්තිමත්භාවයක සලකුනක් නො ව, එක රාජ්‍යයක — එක්සත් ජනපදයේ — ආර්ථික හා මූලෝපායික ආධිපත්‍යය, එහි සියලු ප්‍රතිවාදීන් මත තහවුරු කිරීම මගින්, ලෝක ආර්ථිකය සහ යල් පිනු ජාතික රාජ්‍ය පද්ධතිය අතර පවත්නා අතිමූලික පරස්පර විරෝධතාව, විසඳගැනීමට දැරෙන මංමුලා සහගත ප්‍රයත්නයකි.

වොෂිංටනය, ඇෆ්ඝනිස්ථානය ආක්‍රමනය කිරීමෙන් අනතුරුව, දකුනු ආසියානු කලාපය පුරා සිය ආනුභාවය තහවුරු කරගැනීමේ උත්සාහයක යෙදී ඇත. කලාපීය ගැටුම්, ස්වකීය අධිරාජ්‍ය එල්ලයන්ට බාධකයක් වන තාක් දුරට, බුෂ් ආන්ඩුව ඒවා අවසන් කල යුතු යයි තීන්දු කොට තිබේ. ප්‍රතිවාදී ඉන්දියාව හා පකිස්ථානය සාකච්ඡා මේසයට තල්ලු කෙරී ඇත, නේපාලයේ රජාන්ඩුව හා මාඕවාදී කැරලිකරුවන් අතර සාකච්ඡා දිරිගන්වා තිබේ. ඒ අතරම, "සාම ක්‍රියාදාමය" වැලඳ ගන්නා ලෙස කොලඹ ආන්ඩුව හා එල්ටීටීඊය යන දෙපාර්ශ්වයටම බල කෙරී ඇත. මේ එකදු පියවරකට වත්, දකුනු ආසියාවේ මහජනතාව වෙත "සාමය හා ප්‍රජාතන්ත්‍රවාදය" ගෙනඒම සමග මොන

යම් හෝ සම්බන්ධයක් නොමැත. ඒ වෙනුවට, ඇෆ්ඝනිස්ථාන හා ඉරාක ආක්‍රමන මෙන් ම, ඒවා ද වොෂිංටනයේ ම භූ-දේශපාලනික හා මූලෝපායික ආර්ථික අවශ්‍යතා හඹායාමේ පිලිවෙතෙහි කොටස් ලෙස පවතී.

දැවැන්ත එක්සත් ජනපද සංගත සම්බන්ධයෙන් ගත හොත්, ආර්ථික වසයෙන් ඔට්ටු ඇල්ලීම්වල අගය ඉතා ඉහල ය. චීනය මෙන්ම, ඉන්දියාව ද අන්තර්ජාතික ආයෝජනවල ප්‍රධාන ඉලක්කයක් බවට පත්ව ඇත. ඉන්දියාවෙහි පවත්නා, අසීමිත, ලාභ මෙන්ම උගත්, ශ්‍රම සැපයුම, පරිගනක මෘදුකාංග පර්යේෂන හා සංවර්ධන සහ සේවා කර්මාන්තවල ශීඝ්‍ර ප්‍රසාරනයක් සඳහා පදනම බවට පත්ව තිබේ. චීනයට "ලෝකයේ කම්හල" යන නම පටබැඳී ඇතුවාක් මෙන් ම, ඉන්දියාව, "ලෝකයේ කාර්යාලය" ලෙස ප්‍රසිද්ධියට පත් වෙමින් ඇත. එපමනක් නොව, දකුනු ආසියාව, වොෂිංටනයේ අභිලාෂයන්ට කේන්ද්‍රීය වන මධ්‍යම ආසියාවේ හා මැද පෙරදිග ප්‍රධාන සම්පත්වලින් පොහොසත් ප්‍රදේශවලට මූලෝපායිකව යාබදව පිහිටා ඇත.

ශ්‍රී ලංකාවේ නිල සංස්ථාපිතයේ සෑම කොටසක් ම, ඇෆ්ඝනිස්ථානයට හා ඉරාකයට එරෙහි නීති විරෝධී යුද්ධ ඇතුලු, එක්සත් ජනපද න්‍යාය පත්‍රයට මුලුමනින්ම සහයෝගය දී තිබේ. පාලක කවයන්හි පැවති "විවාද" තුල ආධිපත්‍යය දැරූ ප්‍රධාන කරුන වූයේ, තමන්ගේම අරමුනු වෙනුවෙන්, පවත්නා තත්වය, වඩාත්ම හොඳින් ගසා කෑ හැක්කේ කෙසේ ද යන්න යි. 2001 සැප්තැම්බර් ප්‍රහාරවලට අනතුරුව, එල්ටීටීඊය සාකච්ඡා මේසයට තල්ලු කරගනු පිනිස, එක්සත් ජනපදයේ "ත්‍රස්තවාදයට විරුද්ධ යුද්ධය" මගින් ලබා දුන් අවස්ථාව ඩැහැගැනීමට, කුමාරතුංග අපොහොසත් වූ කල, මහ ව්‍යාපාරිකයෝ, පාර්ලිමේන්තු කුමන්ත්‍රනයකට සමාන වූ නාටකයක් රඟ දැක්වූහ. ශ්‍රීලනිප ආන්ඩුවේ මූලික ඇමතිවරු හා මන්ත්‍රීවරු ගනනාවක් පිල් මාරු කිරීමට පොලඹවාලූ අතර, පෙර මැතිවරනයෙන් යන්තම් වසරක් ඉක්ම යද්දී නව මැතිවරනයක් පැවැත්වීමට, එය තුඩු දුනි.

අලුතෙන් තේරී පත්වූ එජාපෙ ආන්ඩුව, බලයට පැමිනි වහාම, එල්ටීටීඊය සමග සටන් විරාම ගිවිසුමකට එලඹ සාකච්ඡාවන්ට ද අවතීර්න විය. "සාම ක්‍රියාදාමය", වොෂිංටනයේ ඉල්ලීම්වලට අනුගතවීමක් පමනක් නොව, ශ්‍රී ලංකා සංගතවල ගැඹුරුතම අවශ්‍යතා ද නියෝජනය කලේ ය. මෙම අවශ්‍යතා, "යලි පුබුදමු ශ්‍රී ලංකා" නම් වූ වික්‍රමසිංහගේ ආර්ථික වැඩපිලිවෙල තුල සෘජුවම ප්‍රකාශයට පත් විය. ශ්‍රී ලංකාව, 1977 දී විවෘත වෙලඳ පොල පිලිවෙත් වැලඳගත් මුල්ම රටවලින් එකක් වුවත්, විසි අවුරුදු සිවිල් යුද්ධයේ ප්‍රතිඵලයක් ලෙස, පසුපසින් ගාටන තත්වයක පැවතීම ගැන, මෙම ලියවිල්ල මැසිවිලි නැගීය. දැන්, "සාම ක්‍රියාදාමය" පිටුපසින් ආන්ඩුව උත්සාහ කලේ, දිවයින විදේශ ආයෝජන ආකර්ෂනය කරගැනීමේ මූලික භූමියක් බවට පරිවර්තනය කිරීමටයි. ආර්ථික ප්‍රතිසංස්කරන ඇමති මිලින්ද මොරගොඩ සඳහන් කල පරිදි, හොං කොං චීනයට පිවිසෙන දොරටුව බවට පත්ව ඇතුවාක් මෙන්, ඉන්දියාවට පිවිසෙන ආර්ථික හා මූල්‍ය දොරටුව බවට ශ්‍රී ලංකාව පත්කිරීමට නියමිතව තිබුනි.

"යලි පුබුදමු ශ්‍රී ලංකා", ලියවිල්ල, දිවයිනේ යල් පිනූ හා අබලන් පොදු කාර්ය ව්‍යුහය නවීකරනය කිරීමේ, ආන්ඩුවේ වියදම් කප්පාදු කිරීමේ, රාජ්‍ය සතු ව්‍යවසායන් හා සේවාවන් සංගතකරනය හෝ පුද්ගලීකරනය කිරීමේ සහ කම්කරුවන් භුක්ති විඳින තවමත් ශේෂව පවත්නා කොන්දේසි හා අයිතීන් සියල්ල අතුගා දැමීමේ එල්ලයෙන් යුත් පුලුල් ප්‍රතිව්‍යුහකරන පිලිවෙත් මාලාවක්, ඉදිරිපත් කලේ ය. අන් සියල්ලටමත් වඩා, එය, දකුනු ඉන්දියාව තුල පදනම් වූ නව අධි-තාක්ෂන කර්මාන්ත සමග සමීප සබඳතා තහවුරු කරගැනීම සඳහා පූර්ව-කොන්දේසියක් ලෙස, යුද්ධය අවසන් කිරීම ද ඉලක්ක කර ගති.

එනයින් ගත් කල, "සාම ක්‍රියාදාමයේ" අරමුන වූයේ, සාමාන්‍ය වැඩ කරන ජනයාගේ වධ වේදනා පිලිබඳව අවධානය යොමු කිරීම නො ව, එල්ටීටීඊ සාකච්ඡාකරු ඇන්ටන් බාලසිංහම් හැඳින්වූ පරිදි, නව "ව්‍යාඝ්‍ර ආර්ථිකයක්" බවට රට පරිවර්තනය කිරීම පහසු කරනු ඇති, බලය බෙදාගැනීමේ සැලැස්මක්, දිවයිනේ දෙමල, සිංහල හා මුස්ලිම් ප්‍රභූ කොටස් අතර ඇතිකරගැනීමයි.

කෙසේ වෙතත්, පසුගිය දශක පහක කාලය මුලුල්ලේ දෙමල විරෝධී ස්වෝත්තමවාදය මත පදනම් වී ඇති, කොලඹ දේශපාලන සංස්ථාපිතය, සාම සාකච්ඡා හේතු කොටගෙන, ගැඹුරින්ම භේද වී තිබේ. එජාපෙ ආන්ඩුව, එල්ටීටීඊයට අනවශ්‍ය තරම් සහන දෙන්නේ යයි කියමින් මාධ්‍යවල හා රාජ්‍ය නිලධරයේ කොටස් එයට පහර එල්ල කලහ. එමෙන් ම, කුමාරතුංග, මිලිටරියේ ඉහල කොටස්, බෞද්ධ ධුරාවලිය හා විදේශ ප්‍රාග්ධනය ගලා ඒමට විරුද්ධ ව්‍යාපාරික කොටස් වෙනුවෙන් ක්‍රියා කරමින්, සටන් විරාමයටත් සාකච්ඡාවන්ටත් වලකැපීමට පටන් ගති. එල්ටීටීඊය ස්වකීය "සාම" යෝජනා ප්‍රසිද්ධියට පත් කොට දින කිහිපයක් ඇතුලත, කුමාරතුංග, ආරක්ෂාව ඇතුලු ආන්ඩුවේ අමාත්‍යාංශ තුනක් පවරා ගත් අතර, තවත් තුන් මසක් ඇවෑමෙන් ආන්ඩුව ද බලයෙන් පහ කලා ය.

අවසාන විග්‍රහයේ දී, "සාම ක්‍රියාදාමයේ" ඉරනම තීන්දු කෙරෙනු ඇත්තේ, කුමාරතුංග හෝ ඇගේ ශ්‍රී ලංකා ආධාරකරුවන් විසින් නො ව, වොෂිංටනය සහ ලෝකයේ ප්‍රධාන අගනගර තුල දී ය. මේ වන තෙක්, වික්‍රමසිංහ, එක්සත් ජනපදයේ සහයෝගය භුක්ති විඳ ඇති අතර එය, ඔහුගේ විරුද්ධවාදීන් මත තිරිංගයක් සේ ක්‍රියා කොට ඇත. එහෙත්, මොන යම් හෝ මිථ්‍යාවක් ඇති කර ගත යුතු නැත. "ත්‍රස්තවාදී" එල්ටීටීඊය තම සැලසුම්වලට බාධකයක් බවට පත්ව ඇතැයි බුෂ් ආන්ඩුව තීන්දු කල හොත්, එයට එරෙහිව මිලිටරි බලය යොදාගැනීම අනුමත කිරීමටත් රට යලි

සිවිල් යුද්ධය කරා ඇද දැමීමටත් එය පසුබට නො වනු ඇත.

## "ජාතික ස්වාධීනත්වයේ" අවෘත අන්තය

ශ්‍රී ලංකාවේ දේශපාලනය සන්ධිස්ථානයක් කරා ලඟා වී තිබේ. බ්‍රිතාන්‍ය විජිතවාදීන් ශ්‍රී ලංකාවේ ධනපති පන්තියට, ආකාරගතව, පාලන බලය භාර දුන් 1948 දක්වා අතීතයට දිවෙන, “ජාතික ස්වාධීනත්වය” සම්බන්ධ සමස්ත අත්හදා බැලීම ම, පරිපූර්න අවෘත අන්තයක් බව ඔප්පු වී ඇත. පසුගිය 56 වසරක ඉතිහාසය, ලියොන් ට්‍රොට්ස්කිගේ නොනවතින විප්ලව න්‍යායේ මූලික ප්‍රස්තුතවල බලගතු සනාථවීමක් වේ. එනම්, කල් පසු වූ ධනවාදී වර්ධනයක් සහිත රටවල්වල ධනේශ්වර පන්තිය, ජනගහනයේ බහුතරයක අති මූලික ප්‍රජාතන්ත්‍ර අභිලාෂයන් හා සමාජ අවශ්‍යතා පවා සපුරාලීමෙහි ලා දක්වන නොහැකියාවයි.

ආරම්භයේ පටන්ම, ලංකාවේ ප්‍රභු පැලැන්තියට මුහුන දීමට සිදු වූයේ, සිය වඩාත්ම සටන්කාමී හා ධෛර්‍ය සම්පන්න ස්ථරයන් ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරය තුල සංවිධානගතව සිටි බලගතු කම්කරු පන්තියකට ය. නව පාලක පන්තිය, බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයට සමීපව බැඳීගනිමින් ද ලංකාව බ්‍රිතාන්‍ය ඉන්දියාවේ සෙසු ප්‍රදේශවලින් වෙන් කල යුතු යයි අවධාරනය කරමින් ද සිය වරප්‍රසාදිත තත්වය රැකගැනීමට උත්සාහ දැරී ය. බ්‍රිතාන්‍ය විජිතවාදීන් සහ ඔවුනගේ දේශීය ආරක්ෂිතයෝ, එකිනෙකාට අදාල අවශ්‍යතාවන් වඩාත්ම හොඳින් රැකෙනු ඇත්තේ, දිවයින, ඉන්දියානු උප-මහාද්වීපයේ දිගහැරෙන විප්ලවවාදී පිපිරීම්වලින් හුදකලා කරනු පිනිස, පෝක් සමුද්‍ර සන්ධිය හරහා ජාතික දේශසීමාවක් ඇඳීම මගින් ය යන්න පිලිබඳව එකඟතාවකට පැමිනුනහ.

බොහෝ අවස්ථාවන්හි දී, ශ්‍රී ලංකා ධනේශ්වරය, පහලින් වර්ධනය වූ දේශපාලන කැලඹීම්වලට හා සමාජ අසහනයට ප්‍රතිචාර දැක්වූයේ, “භේදකර පාලනය කිරීමේ” පැරනි උපාය යොදාගනිමින් වාර්ගික ආතතීන් උසිගැන්වීමෙනි. 1948 දී බලයට පත්වූ එජාප ආන්ඩුවේ ප්‍රථම ක්‍රියාව වූයේ, 19 වන හා 20 වන සියවස මුල දී බ්‍රිතාන්‍ය තේ හා රබර් වතුවල සේවය පිනිස ගෙනඑනු ලැබූ දෙමල කතා කරන කම්කරුවන්ගේ පුරවැසි අයිතිය අහිමි කිරීමයි. ජනගහනයෙන් සියයට 10ක් නියෝජනය කල දශ ලක්ෂයක් ජනතාව, එක රැයකින්, ඔවුන් දශක ගනනාවක් තිස්සේ ජීවත් වූ රටෙහි “පිටස්තරයන්” බවට ප්‍රකාශයට පත් කෙරුනි. කුමාරතුංගගේ මව වූ සිරිමා බන්ඩාරනායකගේ 1964-65 හා 1970-77 ශ්‍රීලනිප සභාග ආන්ඩු, එජාප පිලිවෙත ඊටත් වඩා එහාට ගෙන ගියේ ය. නව දිල්ලිය සමග ඇති කර ගත් ගිවිසුමක් යටතේ. ලක්ෂ සංඛ්‍යාත දෙමල ජනයා, දකුනු ඉන්දියාවේ ජරාජීර්න කඳවුරුවලට, සමහර අවස්ථාවන්හි දී බලහත්කාරය පවා යොදාගෙන, පිටමං කෙරුනු අතර, ඔවුන්ගෙන් බොහොමයක් තවමත් ඒවායේ දිවි ගෙවති.

1940 ගනන්වල දී හා 1950 ගනන්වල දී දෙමල විරෝධී ස්වෝත්තමවාදයට අශමනීය ලෙස විරුද්ධ වූ ලසසපයේ ට්‍රොට්ස්කිවාදීහු, 1964 වන විට, ජාතිකවාදී දේශපාලන පීඩනයන්ට නතුව, බන්ඩාරනායකගේ සභාග ආන්ඩුවට එක් වූහ. මෙම දැවැන්ත පාවාදීම, වර්ගවාදයේ අබාධිත වර්ධනයන් දිරිගැන්වූ අතර ජනවාර්ගික වෛරය හා බෙදුම්වාදය වැලඳ ගත් — දකුනේ ජවිපෙ හා උතුරේ එල්ටීටීඊය වැනි — සුලු ධනේශ්වර ප්‍රවනතාවල මතුවීමටත් එනයින්, සිවිල් යුද්ධය සඳහා පදනම දැමීමටත් සෘජුව ම වගකිව යුතු වේ.

1971 දී ජවිපෙ, ගම්බද සිංහල තරුනයන්ගේ අසහනකාරී හැඟීම්වලට ආයාචනය කරමින්, ශ්‍රීලනිප නායකත්වයෙන් යුත් සභාග ආන්ඩුවට එරෙහිව නැගිටීමක් සංවිධානය කලේ ය. සිරිමා බන්ඩාරනායක ආරක්ෂක හමුදා යොදාගෙන, නැගිටීම කුඩුකර දැමීමට පමනක් නොව පුලුල්ව වැඩී පැවති අසන්තෘප්තිය මැඩීමට ද ක්‍රියා කලා ය. සිය සහයෝගී පදනම පුනස්ථාපනය කරගැනීමේ උත්සාහයක් ලෙස, ඇය, අනතුරුව, ව්‍යාපාර, අධ්‍යාපනය හා රාජ්‍ය අංශයේ රැකියා යන ක්ෂේත්‍ර තුල, සිංහලයන්ට වාසි සහගත වන පරිදි, වෙනස්කම් කිරීමේ පියවර මාලාවක් ම සංස්ථාපිත කලා ය. මෙම පියවර, බුද්ධාගම රාජ්‍ය ආගම ලෙස ද සිංහල රාජ්‍ය භාෂාව ලෙස ද තහවුරු කල නව වර්ගවාදී ව්‍යවස්ථාවක් මගින්, පරිපූර්නත්වයට පත් කෙරුනි.

දෙමල ජනයා අතර පුලුල්ව පැතුරුනු නුරුස්නාවක් අවුලුවා ලූ බන්ඩාරනායකගේ වැඩපිලිවෙල, ඉන් පසුව බලයට පැමිනි ජේ.ආර්. ජයවර්ධනගේ එජාප ආන්ඩුව විසින් ඩැහැගන්නා ලදි. ජයවර්ධන, ජාතික ආර්ථික පරිපාලන යාන්ත්‍රනය බිඳවිසිරවීම හා ආර්ථිකය විදේශ ආයෝජනයන්ට විවෘත කිරීම දෙසට ප්‍රථම පියවර තැබී ය. මේ පිලිවෙත් වැඩෙන විරුද්ධත්වයකට මුහුන දුන් කල, ඔහු ප්‍රතිචාර දක්වූයේ ද බන්ඩාරනායක කල ආකාරයට ම ය. එනම්, සිංහල ස්වෝත්තමවාදය අවුලුවාලීම හා ප්‍රජාතන්ත්‍ර විරෝධී පියවර පැටවීම මගිනි. 1978 දී ඔහු, පුලුල් ජනාධිපති බලතල සහිත නව ව්‍යවස්ථාවක් හඳුන්වා දුනි. ඉන් වසර පහකට පසුව, 1983 දී, එජාප මැරයන්, දෙමල විරෝධී ජනඝාතන ව්‍යාපාරයක් දියත් කල අතර එය, දශක දෙකක් තිස්සේ ඉදිරියට ගිය සිවිල් යුද්ධය අවුලුවාලීමට තුඩු දුනි.

1987 දී, රට තුල වැඩෙන පන්ති අරගලයට ද ඉන්දියාවෙන් එල්ල වූ පීඩනයට ද මුහුන දුන්, ජයවර්ධන, යුද්ධය අවසන් කිරීමේ සාකච්ඡාවක් සඳහා උත්සාහ දැරී ය. ඔහු, නව දිල්ලිය සමග, උතුරට හා නැගෙනහිරට ඉන්දියානු “සාම-සාධක” හමුදා ගෙන ඒමට ඉඩ දෙන, ගිවිසුමක් අත්සන් කලේ ය. ඔවුන්ගේ කර්තව්‍යය වූයේ, එල්ටීටීඊය නිරායුධ කිරීමත් නව පලාත් සභා ව්‍යුහයක් ලෙස සීමිත ආකාරයකින් බලය විමධ්‍යගත කිරීමත් අධීක්ෂනයයි. එහෙත් ප්‍රතිඵලය ව්‍යසනයක් ම විය. උතුරේ දී ඉන්දියානු හමුදා එල්ටීටීඊය සමග ගැටුනි. දකුනේ දී, ඉන්දු-ලංකා ගිවිසුම තියුනු

දේශපාලන අර්බුදයක් අවුලුවාලී ය. එජාප ආන්ඩුව, කම්කරු පන්තිය ත්‍රස්ත කරනු පිනිස, ස්වෝත්තමවාදී උද්ඝෝෂනයක් දියත් කර තිබූ, ජවිපෙහි සේවය ආරම්භයේ දී යොදාගති. සිය අරමුන ඉටු වූ වහාම, ආන්ඩුව, තමන්ගේ පෙර සගයන් වූ ජවිපෙ මත කඩා පැන්නේ, එම සංවිධානයේ ඉහල නායකයන් ඝාතනය කරමින් හා ඉන් අනතුරුව, ජවිපෙ ආධාරකරුවන් අතුගාදැමීමේ කඩතුරාව යටතේ, දකුනේ ගම්බද විරෝධයට එරෙහිව ජනඝාතක ව්‍යාපාරයක් ද දියත් කරමිනි.

සාමාන්‍ය ජනයා සම්බන්ධයෙන් ගත් කල, එලඹුන විනාශය අතිමහත් ය. මුලු ජනගහනය තවමත් මිලියන 20 කරා ලඟා වී නැති රටක 1971 දී දකුනේ දී ගම්බද තරුනයන් 20,000ක් ඝාතනය කෙරුනු අතර, 1980 ගනන් අග මර්දන ක්‍රියාවලිය තුල තවත් 60,000ක් මරා දැමුනි. සිවිල් යුද්ධය අඩු ගනනේ තව ජීවිත 60,000ක් බිලිගෙන, පන් ලක්ෂයකට අධික ජනකායක් සරනගතයන් බවට පත් කර තිබේ. ශ්‍රී ලංකාවේ ජනතාවට ශිෂ්ඨ සම්පන්න හා සුරක්ෂිත ජීවිතයක් පිලිබඳ අති මූලික අවශ්‍යතාව වත් සම්පාදනය කිරීමෙහි ලා, පාලක පන්තියත් ඔවුනගේ ජාතිකවාදී ඉදිරිදර්ශනයත් පෙන්නුම් කර ඇති පරිපූර්න අසමර්ථභාවය ඔප්පු කිරීමට, මෙම සංඛ්‍යා ලේඛන පමනක් වුව සෑහෙයි.

## සිවිල් යුද්ධය සහ සමාජවාදය

සමාජවාදී සමානතා පක්ෂයත්, එහි පූර්වගාමියා වූ, විප්ලවවාදී කොමියුනිස්ට් සංගමයත්, ආරම්භයේ පටන්ම, සිවිල් යුද්ධයට ස්ථිරසාරව විරුද්ධ වී ඇති එකම පක්ෂයයි. සැබෑ හා කල් පවත්නා සාමයක් සඳහා පදනම දැමිය හැකි එකම ක්‍රමය ලෙස, උතුරෙන් හා නැගෙනහිරෙන් ශ්‍රී ලංකා මිලිටරි හමුදා වහාම හා කොන්දේසි විරහිතව ඉවත් කල යුතු යයි අපි ඉල්ලා සිටිමු. යුද්ධය නතර කිරීමේ සිය වැඩපිලිවෙල ඉදිරිපත් කිරීමේ දී, සසප එක් අනභියෝගී මූලධර්මයකින් මෙහෙය වෙයි. එනම්, කම්කරු පන්තියට, ධනේශ්වර පක්ෂවලින් හා ධනපති රාජ්‍යයෙන්, සිය දේශපාලන ස්වාධීනත්වය තහවුරු කරගැනීමෙහි ලා පවත්නා අවශ්‍යතාවයි.

වික්‍රමසිංහගේ හෝ කුමාරතුංගගේ අනුග්‍රහය යටතේ සාමය තහවුරු කරගත හැකැයි විශ්වාස කිරීම මිථ්‍යාවකි. එයට ප්‍රතිකූලව, කම්කරුවන් එජාපයට හා ශ්‍රීලනිපයට බැඳී සිටින තාක් දුරට, පසුගිය පනස් වසරක අත්දැකීම් පෙන්නුම් කරන්නේ, සාමාන්‍ය ශ්‍රී ලාංකිකයන් යුද තර්ජනයට සදාකල් මුහුන දෙනු ඇති බවයි. කම්කරු පන්තිය පමනක් ම, කල් පවත්නා විසඳුමක් සැපයීමට සමත් වෙයි. ඒ, පරිපීඩිත ගම්බද ජනයාට ආයාචනය කිරීම මගින්, ජාතිවාදයේ, ස්වෝත්තමවාදයේ හා බෙදුම්වාදයේ සියලුම රූපාකාරයන් පොදුවේ ප්‍රතික්ෂේප කරමින්, දෙමල, සිංහල, මුස්ලිම් හා ක්‍රිස්තියානි ජනයා ඒකාබද්ධ කිරීම මගින්, සහ එම පදනම මත, කම්කරු-ගොවි ආන්ඩුවක් සඳහා මහජන විප්ලවවාදී ව්‍යාපාරයක් වර්ධනය කිරීමෙනි.

සසප, ආයුධ බලයෙන් ඒකීය රාජ්‍යය පවත්වා ගෙන යාමට විරුද්ධ ය. එවන් පිලිවෙතක්, දෙමල ජනයාගේ ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට පහර දෙනවා පමනක් නො ව, රට පුරා මිලිටරිවාදයේ ආධිපත්‍යය තහවුරු කිරීමටත් ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට වලකැපීමටත් නොවැලැක්විය හැකි ලෙසම තුඩු දෙයි.

එමෙන් ම, සසප, දෙමල ඊලම් නමින් වෙනම ධනපති රාජ්‍ය නට්ටක් පිලිබඳ එල්ටීටීඊයේ ඉල්ලීමට ද විරුද්ධ වෙයි. මෙම ඉල්ලීම මගින් ප්‍රකාශයට පත් කෙරෙන්නේ, දෙමල මහජනතාවගේ අවශ්‍යතා නො ව, පීඑල්ඕ, ඒඑන්සී සහ අයිආර්ඒ වැනි සෙසු ජාතික ව්‍යාපාරවල ධනපති නායකයන් මෙන්, කම්කරු පන්තිය සූරාකෑම සඳහා භූගෝලීය ප්‍රාග්ධනය සමග තමන්ගේම සබඳතා තහවුරු කරගැනීමට ප්‍රාර්ථනා කරන, දෙමල ධනේශ්වරයේ අවශ්‍යතා ය. එල්ටීටීඊය උතුරේ හා නැගෙනහිර පාලනය භාර ගත හොත්, එය, දෙමල කම්කරුවන්ගේ ඍජු වියදමින්, අන්‍යොන්‍ය වසයෙන් වාසිදායක එකඟතාවන් තහවුරුකරගැනීමට, භූගෝලීය ආයෝජකයන්ට ක්ෂනිකවම ආයාචනා කරනු ඇත.

එමෙන් ම, සසප, "සාම" ගිවිසුමක කොටසක් ලෙස යෝජනා කෙරී ඇති, බලය බෙදාහැරීමේ විවිධාකාර සැලසුම්වලට ද විරුද්ධ ය. මෙම සැලසුම්වල පොදු ලක්ෂන දෙකක් පවතී: එනම් ජාතිවාදය හා ප්‍රජාතන්ත්‍ර අයිතීන් පිලිබඳ පිලිකුලයි. ඒවා සියල්ලටම අන්තර්ගත වන්නේ, උතුරේ හා නැගෙනහිර පලාත්වල, භූගෝලීය ප්‍රාග්ධනයේ ආඥාවන් ක්‍රියාවට දැමීමේ දී කොලඹ ආන්ඩුව සමග සහයෝගීව කටයුතු කරන, වර්ගවාදය මත පදනම් වූ, අන්තර් පාලනයක්, ඡන්දයෙන් තෝරාපත් කරගැනීමකින් තොරව, ඉහලින් පැටවීමයි. එල්ටීටීඊයේ යෝජනා අනුව, එම පාලන මන්ඩලය තුල, තම සංවිධානයට බහුතරයක් මෙන් ම, වසර පහක කාලයකට, සියලු නිලධාරින් බඳවාගැනීම හා ඉවත් කිරීම ද දිස්ත්‍රික්ක කමිටු පත් කිරීම හෝ විසුරුවාහැරීම ද ඇතුලත්ව, උතුරු හා නැගෙනහිර පලාත්වල පරිපාලනය සම්බන්ධයෙන් පුලුල් බලතල, විශේෂිතව සහතික කෙරෙයි. එමෙන් ම, මුස්ලිම්, දෙමල හා සිංහල ජනවර්ග අතර භේදයන් සංස්ථාපිත කිරීම, නොවැලැක්විය හැකි ලෙස ම, අනාගත වාර්ගික ආතතීන් හා ගැටුම් සඳහා පදනම දමනු ඇත.

සැබෑ ප්‍රජාතන්ත්‍රවාදී විසඳුමක් සඳහා පදනම දමනු පිනිස, ව්‍යවස්ථාවක් කෙටුම්පත් කිරීමේත් ප්‍රජාතන්ත්‍ර අයිතීන් පිලිබඳ සියලු නොවිසඳුනු ගැටලු විසඳාලීමේත් බලතල සහිත, ව්‍යවස්ථා සම්පාදක මන්ඩලයක් කැඳවීමට, සසප සටන් වදී. 1972 හා 1978 ව්‍යවස්ථා කෙටුම්පත් කිරීම පිනිස ගෙනගියා වූ ද මෙම මැතිවරනයෙන් පසුව යලි ක්‍රියාවට දැමීමට කුමාරතුංගට අවශ්‍යව ඇත්තා වූ ද නරුම අභ්‍යාසය සමග, මොන යම් හෝ පොදු බවක්, සසප යෝජනාවලට ඇත්තේ

නැත. බහුතරයකගේ අවශ්‍යතා සැබැවින්ම ප්‍රකාශයට පත් කරන නව ව්‍යවස්ථාවක් කෙටුම් පත් කල යුත්තේ, මහජනතාවට හොරෙන් ධනපති දේශපාලනඥ කල්ලි විසින් නො ව, සාමාන්‍ය වැඩ කරන ජනතාව විසින්, ඔවුන් වෙනුවෙන්, විවෘතව හා ප්‍රජාතන්ත්‍රවාදීව, තෝරා පත් කර ගැනෙන, එම ජනයාගේ ම නියෝජිතයන්ගෙන් සමන්විත, මන්ඩලයක් විසිනි.

සැබෑ ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කිරීම, ආගම හා රාජ්‍යය එකිනෙකින් වෙන්කිරීමෙන් තොරව කල නො හැකි ය. මෙයින් අදහස් කෙරෙන්නේ, රාජ්‍ය ආගම ලෙස බුද්ධාගමට දී ඇති තැන අහෝසි කිරීම සහ ආගමික සංවිධානවලට ලැබෙන සියලු රාජ්‍ය සහනාධාර නතර කිරීමයි. එය ඉල්ලා සිටින්නේ, වතුකරයේ දෙමල ජනයාට සිය පූර්න අයිතීන් අහිමි කිරීම දිගටම පවත්වා ගෙනයන නීතිමය බාධක ද ඇතුලු, සියලු මර්දනකාරී හා වෙනස්කම් කිරීමේ නීති ද, ඒ සමගම, මහජන ආරක්ෂක පනත, හදිසි නීති රෙගුලාසි සහ ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත ද අහෝසි කිරීම යි.

## ශ්‍රී ලංකා හා ඊලම් එක්සත් සමාජවාදී සමූහාන්ඩුවක්

වෙන් වෙන් ජාතික රාජ්‍යවල පාලකයන් ලෙස විවිධ දේශීය ධනේශ්වරයන් අතට බලය ලබා දුන්, ඉන්දියානු උප-මහාද්වීපයේ පශ්චාත්-ස්වාධීන සමථය, කම්කරු පන්තිය හා පීඩිත මහජනතාව සඳහා නිර්මානය කර ඇත්තේ, ව්‍යසනයකට අඩු දෙයක් නො වේ. පසුගිය වසර 50 තිස්සේ, පාලක ප්‍රභූන් සිය පාලනයන් පවත්වාගෙන යාමට උත්සාහ දරා ඇත්තේ, ජාතික හා කලාපීය ගැටුම් ඇවිස්සීම මගිනි. එම පිලිවෙත වඩාත්ම පැහැදිලිව ප්‍රකාශයට පත්වී ඇත්තේ, න්‍යෂ්ටික බලයෙන් සන්නද්ධ ඉන්දියානු හා පකිස්ථාන රාජ්‍ය දෙක අතර දිග්ගැසුන ගැටුම මගිනි.

ධනේශ්වර පාලනය යටතේ ජාතික ස්වාධීනත්වය මගින්, අධිරාජ්‍යවාදී ආධිපත්‍යය අවසන් කිරීමක් අදහස් නො කෙරන අතර, එය හුදෙක්, එහි රූපාකාරයේ වෙනසක් පමනකි ය යන ට්‍රොට්ස්කිවාදී විශ්ලේෂනය, සනාථ වී තිබේ. පශ්චාත්-යුදකාලීන උත්පාතය තුල දී, යම් කාලයකට, සීමිත ආර්ථික වර්ධනයක් මගින්, ආර්ථික හා සංස්කෘතික ඉදිරි වර්ධනයක් පිලිබඳ බලාපොරොත්තු පවත්වාගෙන යාමේ හැකියාව, හැම ආකාරයකම ධනේශ්වර දේශපාලනඥයන්ට, ලබා දී තිබූ නිසා, මෙම සත්‍යය, යම් මට්ටමකට යටපත් කෙරී පැවතුනි. එහෙත් පසුගිය වසර 20ක කාලය මුලුල්ලේ, ලෝක ආර්ථිකයේ සිදුව ඇති අති මහත් වෙනස්කම්, — භූගෝලීය නිෂ්පාදන ක්‍රියාදාමයන් — ජාතික ආර්ථික වර්ධනය පිලිබඳ වැඩපිලිවෙලට සඳහටම අවසන් තිත තබා ඇත.

උප-මහාද්වීපය පුරා කෝටි සංඛ්‍යාත ජනයා, වචනයෙන් විස්තර කල නොහැකි, දරිද්‍රතාවේ කොන්දේසිවලට ඇද වැටී ඇතුවා පමනක් නො ව, සිය ප්‍රතිවාදීන්ට එරෙහිව, ලාභ පොදි අරභයා තරග වදිනු පිනිස, එක් එක් ජාතික හා ප්‍රාදේශීය ඒකකයන් මත ක්‍රියාත්මක වන දැඩි පීඩනය, භාත්‍රෘභාරක ආගමික, ජනවාර්ගික හා බෙදුම්වාදී ආතතීන් මාලාවක් ම අවුලුවා තිබේ.

දකුනු ආසියානු එක්සත් සමාජවාදී සමූහාන්ඩුවක කොටසක් ලෙස, ශ්‍රී ලංකා හා ඊලම් එක්සත් සමාජවාදී සමූහාන්ඩුවක් සඳහා ගෙන යන අරගලයට ම පමනක්, මෙම කලාපයේ සියලු ජනතාවන්ගේ පූර්න ආර්ථික හා සංස්කෘතික වර්ධනය සහතික කල හැකි ය. භූගෝලීය නිෂ්පාදන බලවේගවල සහේතුක වර්ධනය මගින්, දැන් දරිද්‍රතාව, සාගින්න හා පීඩනය අවසන් කිරීම, ජයගතහැකි ඉලක්කයක් බවට පත් කර ඇති අතර, එම නිෂ්පාදන බලවේග, ජාතික රාජ්‍යයේ හා ලාභ ගැරීමේ ක්‍රමයේ දඬුඅඬුවලින් නිදහස් කරගෙන, සියලු මනුෂ්‍ය වර්ගයාගේ අවශ්‍යතා සපුරනු පිනිස යොදාගත යුතු ය. එය, සහේතුක ලෙස සැලසුම් කෙරුනු, භූගෝලීය සමාජවාදී ආර්ථිකයක් වර්ධනය කිරීමේ පොදු අරගලයක් තුල, කලාපය පුරා හා ජාත්‍යන්තර පරිමානව, කම්කරු පන්තිය ඒකාබද්ධ කිරීම ඉල්ලා සිටී. සමාජවාදී විප්ලවයේ ලෝක පක්ෂය වන හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ කොටසක් ලෙස, සසප සටන් වදින්නේ මෙම ඉදිරිදර්ශනය සඳහා ය.

## ගැඹුරු වන සමාජ අසමානතාව

1940 ගනන් හා 1950 ගනන්වල දී, කම්කරු පන්තියේ අරගලවල ප්‍රතිඵලයක් ලෙස, නිදහස් අධ්‍යාපනය, සෞඛ්‍ය සේවය, විශ්‍රාම වැටුප් හා සුබසාධන සේවා සපයන, ආසියාවේ වඩාත්ම දියුනු සුබසාධක රාජ්‍යය ලෙස, උදම් ඇනීමේ හැකියාව ශ්‍රී ලංකාවට තිබුනි. එහෙත් පසුගිය අඩ සියවසක කාල පරිච්ඡේදය තුල දී, අනුප්‍රාප්තික එජාප හා ශ්‍රීලනිප ආන්ඩු විසින්, මෙම ජයග්‍රහන අනුක්‍රමයෙන් වඩවඩාත් විනාශ කර දමනු ලැබ ඇත.

වික්‍රමසිංහගේ "යලි පුබුදමු ශ්‍රී ලංකා" ලියවිල්ලේ අඩංගු නිල සංඛ්‍යා ලේඛන පවා, ධනපති පාලනය පිලිබඳ නොවරදින දෝෂාභියෝගයකි.

- ජනගහනයෙන් සියයට 25 හා 40 අතර කොටසක්, චිරකාලික හා තාවකාලික දරිද්‍රතාවයෙන් පීඩාවට ලක්ව ඇත. දිනකට ඇමරිකානු ඩොලර් 2ක ආදායම, අවශ්‍ය අවම සීමාව ලෙස ගත හොත්, සියයට 45කට වැඩි පිරිසක් දරිද්‍රතා රේඛාවෙන් පහලින් සිටිති. බොහෝ දෙනෙක් ගොවිතැනින් හා ධීවර කර්මාන්තයෙන් දිවි ගැටගසා ගන්නා, ඌව හා වයඹ වැනි ගම්බද පලාත්වලින්, සියයට 50කට අධික දරිද්‍රතා අනුපාතිකයන් වාර්තා වේ.
- ගම්බද පලාත්වල ජනයාගෙන් තුනෙක් දෙකකට වැඩි කොටසකට, විදුලි බලය නොමැති අතර හරි අඩක් පමන දෙනා, පිරිසිදු

ජලය හෝ සෞඛ්‍ය සම්පන්න වැසිකිළි පහසුකම් නොමැතිකමින් පීඩා විඳිති. නල ජලය ඇත්තේ රටේ ජනගහනයෙන් සියයට 29කට පමනක් වන අතර, අපද්‍රව්‍ය බැහැර කිරීමේ විශාල පරිමාන පහසුකම් පවතින්නේ කොලඹ අගනගරයේ පමනි.

- 300,000ක් පමන වන, ප්‍රධාන කොටම ගම්බද තරුනියෝ, සිය පවුල්වල නඩත්තුව සඳහා මුදල් යවනු පිනිස, රටේ රෙදිපිළි හා ඇඟලුම් ක්ෂේත්‍රයේ වහල් ශ්‍රම කඳවුරු තුල ශ්‍රමය වැය කරති. තවත් 400,000ක් පමන වන මිනිස්සු හා කාන්තාවෝ, මැද පෙරදිග, බොහෝ සෙයින් අඩු වැටුප් සහිත පහත්ම රැකියාවන්හි, ලාභ සංක්‍රමනික ශ්‍රමිකයන් ලෙස කඹුරමින්, සිය පවුල් නඩත්තු කරනු පිනිස මුදල් හරිහම්බ කරති. සෙසු සමහර පවුල් නඩත්තු වන්නේ, වෙනත් කිසිදු විකල්ප රැකියාවක් නොමැති තතු තුල, සන්නද්ධ හමුදාවන්ට එක්ව සිටින තරුනතරුනියන් 200,000ක් වෙතින් ලැබෙන ආදායමෙනි.
- ජාතික පරිමාන පර්යේෂනාත්මක අධ්‍යයනවලට ඇතුලත් නොවන, යුද්ධයෙන් විනාශයට පත්වූ උතුරු හා නැගෙනහිර පලාත්වල, ජනගහනයෙන් සියයට 40ක් පමන දෙනා අවතැන්ගතව සිටිති. ඔවුන්ගෙන් බොහොමයක් තවමත් දිවි ගෙවන්නේ, අප්‍රමානවත් හා සනීපාරක්ෂාවට අහිතකර කොන්දේසි යටතේ පවත්වාගෙන යන, අවශ්‍ය පහසුකම්වලින් තොර, සරනගත කඳවුරුවල ය. එම පලාත්වල නිවාස සංඛ්‍යාවෙන් තුනෙන් එකක් හා හරි අඩක් අතර ප්‍රමානයක් අලාභහානිවලට හෝ විනාශයට ලක්ව ඇත. සෑම පවුල් 12කට ම එකක එක් සාමාජිකයකු වත් යුද්ධයේ සෘජු ප්‍රතිඵලයක් ලෙස ඝාතනයට ලක්ව ඇත. දිළිඳුම පවුල් අතර එම අනුපාතය 7කට එකකි. ත්‍රිකුනාමල දිස්ත්‍රික්කයේ කල එක් අධ්‍යයනයකින් සොයා ගත් පරිදි, අවුරුදු 5ට අඩු සියලු දරුවන්ගෙන් සියයට 27ක් කුරු බවට පත්ව ඇති අතර, සියයට 26ක් බෙලහීනත්වයෙන් පෙලෙති. සියයට 50ක් දෙනා අඩු බරෙන් යුක්ත ය.
- නිල විරැකියා අනුපාතිකය ඉහල නගින අතරම, දරිද්‍රතා රේඛාවෙන් පහල සිටින්නන්ගෙන් සියයට 95ක්ම "වැඩ කරන දුගීන්" ය. අඩු වැටුප් ලබමින් වැඩි පැය ගනනක් වැඩ කරන, තදබදයෙන් යුක්තව සනීපාරක්ෂාවට අහිතකර කොන්දේසි යටතේ දිවි ගෙවන, දෙමල කතා කරන වතු කම්කරුවන්ගෙන් බහුතරයක් ද මෙම කොටසට ඇතුලු වෙති. කොලඹ නගරයේ, මසකට ඇමරිකානු ඩොලර් 30 හා 60 අතර වැටුප් මට්ටම් සුලභ ය.

සමාජ බෙදීමේ ඉහල කෙලවරේ, ප්‍රධාන බැංකු සහ සංගත, සැලකිය යුතු මට්ටමේ ලාභ පොදි ගසා ගෙන ඇත. පසුගිය වසරේ මුල් කාර්තු තුන සඳහා ශ්‍රී ලංකා හේලීස් ලිමිටඩ් සංගතය, බදුවලින් පසු ලාභය ලෙස රුපියල් මිලියන 605.3ක් වාර්තා කල අතර, ඩීඑෆ්සීසී බැංකුව සිය ලාභය සියයට 16කින් ඉහල දමා ගති. 2003 වසර සඳහා, සේලාන් බැංකු සමූහය, බදුවලින් පසු ලාභය ලෙස රුපියල් බිලියන 1.026ක් උපයා ගත්තේ ය. බොහෝ සමාගම් කිසිදු බද්දක් නො ගෙවති. ලියාපදිංචි සමාගම් 32,000කින් බදු විස්තර ගොනු කර ඇත්තේ 9,000කි. ඉන් බදු ගෙවා ඇත්තේ 2,850ක් පමනි.

1990 ගනන්වල දී ආර්ථික වර්ධනය සියයට 5.1ක සාමාන්‍ය මට්ටමක පැවතුන නමුත්, එය, "දරිද්‍රතා මට්ටමේ කැපී පෙනෙන අඩුවීමක් ඇති කිරීමට" අසමත් වූ බව "යලි පුබුදමු ශ්‍රී ලංකා" ලියවිල්ල පිලිගනී. "වෙනත් වචනවලින් කිය තොත්, ආර්ථික වර්ධනය ස්වයංක්‍රියව දුගීන් වෙත පහලට කාන්දු වී නැත." මෙය, දශකයක් තිස්සේ එජාප හා ශ්‍රීලනිප ආන්ඩු යටතේ එක සේ ක්‍රියාවට දැමුනු, වෙලඳ පොල ප්‍රතිසංස්කරන පිලිවෙත් මගින්, සමාජ අසමානතාව තවත් උත්සන්න කෙරී ඇති බව විවෘතව පිලිගැනීමකට සම වේ.

එජාපෙ පිලිවෙතෙහි ප්‍රහාරවලට ලක්ව ඇත්තේ, කම්කරු පන්තිය වීම පුදුමයට කාරනාවක් නො වේ. "ආසියාවේ රාජ්‍ය අංශයේ සේවකයන්ගේ ඉහලම අනුපාතය පවතින රට බවට ශ්‍රී ලංකාව පත් කරමින්" ශ්‍රම බලකායෙන් සියයට 17ක්, රාජ්‍ය සතු ව්‍යවසායන් ඇතුලු රාජ්‍ය අංශය තුල සේවයේ නියුතු බව "යලි පුබුදමු ශ්‍රී ලංකා" සටහන් කරයි. කුමාරතුංග යටතේ ක්‍රියාවට දැමුනු සංගතකරන හා පුද්ගලීකරන වැඩපිලිවෙල වේගවත් කිරීම මගින් මෙම තත්වය නිවැරදි කිරීමට එජාපෙ ආන්ඩුව සැලසුම් කර තිබේ. රැකියා දස දහස් ගනනක් දැනටමත් විනාශ කෙරී ඇති අතර, වරාය, දුම්රිය, විදුලි බල, රාජ්‍ය බැංකු සහ සෙසු අංශවල සැලසුම් කෙරුනු ප්‍රතිව්‍යුහකරනයන් ඉදිරියට යන කල, තවත් රැකියා විශාල සංඛ්‍යාවක් අහෝසි කෙරෙනු ඇත. පසුගිය නොවැම්බරයේ ඉදිරිපත් කල අයවැය, 2004 දී රාජ්‍ය අංශයේ රැකියා 100,000ක් ද 2006 දී තවත් රැකියා 200,000ක් ද කප්පාදු කිරීම පිලිබඳව අනතුරු ඇඟවී ය.

සෑම අංශයක් ම "වෙලඳ පොල බලවේගවලට" විවෘත කෙරෙමින් පවතී. 2002 තුල දී, මහජන සෞඛ්‍ය සේවාවන් සඳහා ආන්ඩුව කල වියදම්, දල දේශීය නිෂ්පාදිතයෙන් සියයට 1.7 සිට සියයට 1.5 දක්වා කප්පාදු කෙරුනු අතර, මහජන අධ්‍යාපනයට කෙරුනු වියදම්, සියයට 2.5 සිට සියයට 2.3 දක්වා කපා හැරුනි. මෙම කප්පාදු සිදු කෙරුනේ, මෙම සේවාවන් තුල පුද්ගලික අංශය දිරිමත් කරනු පිනිස ය. නිදසුනක් ලෙස, ගුරු පුහුනුව, පුද්ගලික ඒජන්සිවලට කොන්ත්‍රාත් පදනමින් භාර දී තිබේ. 2004 වසරේ දී පමනක්, රජයේ පාසල් 300ක් "අශක්‍ය" ලෙස ප්‍රකාශයට පත් කොට වසා දමා තිබේ. එජාපෙ ආන්ඩුව, කුඩා ගොවීන්ගේ පොහොර

සහනාධාරය කප්පාදු කර ඇත. එමගින්, මෙම තීරනාත්මක කෘෂි අමුද්‍රව්‍යයේ එක මිටියක මිල එකවර රුපියල් 350 සිට රුපියල් 950 දක්වා ඉහල දමා තිබේ. දහස් ගනන් ගොවීන්ගේ ජීවනෝපායන් මෙමගින් විනාශයට ලක් කෙරුනු අතර ගම්බද ප්‍රදේශවල සිය දිවි නසා ගැනීමේ සංඛ්‍යාව ඉහල නැගීමට එම තත්‍ව සෘජුවම තුඩු දී ඇත.

## කම්කරු පන්තියට සමාජවාදී ක්‍රියාමාර්ගයක්

සසප ඉදිරිපත් කරන්නේ, තුනී ධනවත් සුලුතරයක් වෙනුවෙන් ලාභ පොදි තරකිරීම හා දැවැන්ත පරිමානයෙන් පුද්ගලික ධනය ඒකරාශී කිරීම නො ව, සමස්තයක් ලෙස ජනගහනයේ මානුෂික අවශ්‍යතා සපුරාලීම, සිය සංවිධානමය මූලධර්මය කරගත් ආර්ථික ක්‍රමයකි. එවන් සමාජ පරිවර්තනයක් සඳහා ආර්ථික පදනම් තහවුරු කිරීම අරඹනු පිනිස, අපි, සියලුම විශාල බැංකු හා මූල්‍ය ආයතන ජනසතු කිරීම, නිදහස් වෙලඳ කලාප තුල ක්‍රියාත්මක වන ආයතන ද ඇතුලු මහා පරිමානයේ කාර්මික හා නිෂ්පාදන සංගත සියල්ල පොදු අයිතියට හා පොදු පාලනයට යටත් ව්‍යවසායන් බවට පරිවර්තනය කිරීම සහ සියලු තීරනාත්මක ස්වාභාවික සම්පත් පොදු අයිතියට හා පාලනයට යටත් කිරීම ඉල්ලා සිටිමු.

### ❍ සියලු දෙනාටම සුරක්ෂිත හා මනා වැටුප් සහිත රැකියා

විරැකියාව වත්මන් ආර්ථික පර්යායට ආවේනික ලක්ෂනයකි. මෙයින් දරුනු ලෙසම පීඩාවට පත්ව ඇත්තේ තරුනයන් ය. අවුරුදු 14-18 අතර විරැකියා අනුපාතය දැන් සියයට 36 මට්ටමේ පවතින අතර අවුරුදු 19-25 අතර එය සියයට 30කි. මෙයින් අදහස් කෙරෙන්නේ, 30,000ත් 40,000ත් අතර සංඛ්‍යාවක් යයි තක්සේරු කර ඇති විශ්වවිද්‍යාල උපාධිධාරීන්ගේ — සමස්ත පරම්පරාවකම පාහේ — නිපුනතා සහ විභවයන් අපතේ යන බවයි. එමෙන් ම, අවුරුදු 5-17 අතර වන දශ ලක්ෂයකට ආසන්න ලමුන් සංඛ්‍යාවකට, දරිද්‍රතාවයෙන් පෙලෙන සිය පවුල් ජීවත් කරවනු පිනිස, විවධ රැකියාවන්හි නිරත වීමට බල කෙරී ඇත. මොවුන්ගෙන් හරි අඩක් අවුරුදු 15ට අඩු අයය.

වැටුප් අඩු නො කර, වැඩ සතිය පැය 30කට අඩු කිරීම මගින් රැකියා අවස්ථා පුලුල් කල යුතු යයි සසප යෝජනා කර සිටී. මනා වැටුප් සහිත රැකියා ලක්ෂ ගනන් නිර්මානය කිරීමටත් වහාම අවශ්‍යව පවතින පොදු නිවාස, පාසල්, රෝහල්, මංමාවත් සහ වාරිමාර්ග, විශේෂයෙන් ම යුද්ධයෙන් ව්‍යසනයට පත්ව ඇති උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල, ගොඩනැගීමටත් පොදු කාර්ය ව්‍යාපෘති සැලසුමක් සඳහා රුපියල් බිලියන ගනන් යෙදවිය යුතු ය.

මූර්ත වැටුප් දිගටම කඩා වැටී තිබේ — 1999-2002 කාල පරිච්ඡේදය තුල දී පුද්ගලික අංශයේ සේවකයන් හා කෘෂිකාර්මික කම්කරුවන් අතර එම කඩා වැටීම සියයට 10 ඉක්මවී ය. සියලු කම්කරුවන් සඳහා අවම වැටුප මසකට රුපියල් 10,000 දක්වා වහාම ඉහල දැමිය යුතු යයි සසප යෝජනා කරයි. එමෙන් ම එම වැටුප ජීවන වියදම අනුව ස්වයංක්‍රීයව ඉහල යා යුතු ය.

සියලු ආකාරයේ ළමා ශ්‍රම සූරාකෑමත් තරුනයන් හා කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීමත් අවසන් කල යුතු යයි අපි කියා සිටිමු. ඔවුන්ගේ හැකියාවන් වර්ධනය කරගැනීමට, සියලු තරුනතරුනියන් සඳහා, ආන්ඩුව විසින් පවත්වාගෙන යනු ලබන, දීමනා සහිත වෘත්තීය පුහුනු වැඩපිලිවෙලවල් ද මනා උපකරන සහිත සංස්කෘතික හා ක්‍රීඩා පහසුකම් ද සම්පාදනය කල යුතු ය. කාන්තා කම්කරුවන්ට සමාන වැටුප්, පූර්න වැටුප් සහිත මාතෘ නිවාඩු සහතික කල යුතු අතරම, මනා උපකරනවලින් හා පුහුනු සේවක මන්ඩලවලින් යුක්ත ලදරු සුරැකුම් පහසුකම් නොමිලයේ සැපයිය යුතු ය.

### ❍ *ගුනාත්මකව ඉහල මට්ටමේ නිදහස් අධ්‍යාපනයක්*

තමන්ගේ දක්ෂතාවන් ද නිර්මාන ශක්තිය ද පරිපූර්නව වර්ධනය කරගැනීම සඳහා සියලු තරුනතරුනියන්ට අවස්ථාව සැලසිය යුතු ය. වර්තමානයේ, අධ්‍යාපන ක්‍රමය අසමානතාව මගින් දෙකට බෙදී පවතී — කම්කරු පන්තික හා ගම්බද ප්‍රදේශවල ලමුන්ට, අවශ්‍ය පහසුකම්වලින් හා ප්‍රමානවත් කාර්ය මන්ඩලයකින් තොර රජයේ පාසල් තුල, අධ්‍යාපනය ලැබීමට බල කෙරී ඇති අතර, ධනවතුන්ගේ දූ පුත්තු මුදලට ගත හැකි දියුනු සම්පත්, විධික්‍රම හා තාක්ෂනය ඇතුලු සියලු පහසුකම් භුක්ති විඳිති. තමන්ගේ අධ්‍යාපනය වර්ධනය කරගැනීමට අවශ්‍ය සියලු දෙනාටම, සරසවි මට්ටම ද ඇතුලත්ව ඒ දක්වාම, ගුනාත්මකව ඉහල අධ්‍යාපනයක්, නොමිලේ සපයනු පිනිස, පොදු අධ්‍යාපන ක්‍රමය දැවැන්ත ලෙස පුලුල් කල යුතු යයි සසප කියා සිටී. පවත්නා පාසල් ද අධ්‍යාපන ආයතන ද විද්‍යාගාර, පරිගනක පහසුකම් සහ නවතම ශ්‍රව්‍ය-දෘශ්‍ය අධ්‍යාපන විධික්‍රම මෙන් ම ක්‍රීඩා හා කලා පහසුකම් සපයා සංවර්ධනය කල යුතු ය.

### ❍ *පොදු, යහපත් සෞඛ්‍ය සේවාවක් හා සුබසාධක වැඩපිලිවෙලක්*

වෛද්‍ය විද්‍යාවේ පවත්නා විප්ලවවාදී වර්ධනයන් තිබිය දී ම, ශ්‍රී ලංකාවේ, සෑම වසරක් පාසාම, දහස් සංඛ්‍යාත ජනයා, වැලැක්විය හැකි රෝගවලින් මිය යයි. ආන්ඩුව වෛද්‍ය සේවාවන්හි සිදු කොට ඇති කප්පාදු හේතු කොටගෙන, රට පුරා මැලේරියාව, පාචනය හා කම්මුල්ගාය වැනි රෝග පැතිරීම ඉහල ගොස් තිබේ. වෛද්‍යවරයකුගෙන් ප්‍රතිකාර නියමකරවා ගැනීම සඳහා රුපියල් 300ක් පමන වැය වන අතර බොහෝ කම්කරුවන්ට බෙහෙත් මිලදී ගැනීමට හැකියාවක් නැත. රජයේ රෝහලක හෘද ශල්‍යකර්මයක් සඳහා පොරොත්තු ලැයිස්තුව දැන් වසරකට වඩා දිග්ගැසී ඇත. එහෙත් රුපියල් 300,000ක් වැය කල

හැකි අයට, එම ශල්‍යකර්මය පුද්ගලික රෝහලකින් වහාම කර ගත හැකි ය.

සැම දෙනාටම ගුනාත්මකව ඉහල මට්ටමේ සෞඛ්‍ය සේවාවන්, නොමිලේ සපයනු පිනිස, මනාව සජ්ජිත හා මනාව පිරිස් බල සම්පාදිත රජයේ රෝහල් හා සායන වර්ධනය කිරීමට දැවැන්ත වැඩපිලිවෙලක් ඇරඹිය යුතු යයි සසප කියා සිටී. කාන්තාවන්ට ගබ්සා කර ගැනීමේ අයිතිය සහතික කල යුතු ය.

දරිද්‍රතාව, ප්‍රමානවත් ලෙස ආහාර නොමැතිකම සහ මන්ද පෝෂනය තවමත් පුලුල්ව පැතිර පවතී. වසර 2000 දී, රට පුරා, වයස අවුරුදු පහට අඩු දරුවන් අතර, කුරු බව සියයට 13.5ක් ද බෙලහීනකම සියයට 14ක් ද බර අඩුකම සියයට 29.4ක් ද විය. මාතෘ මන්ද පෝෂනය ද දුස්සාධ්‍ය තත්වයේ පවතී: ගැබිනි කාලය තුල දී, කාන්තාවන්ගෙන් සියයට 35ක් රක්තහීනතාවයෙන් පෙලුනු අතර, බර වැඩිවීමේ සාමාන්‍යය, අවම අවශ්‍යතාවට වඩා සැලකිය යුතු මට්ටමකින් පහලින් තිබුනි. දේශපාලන අරමුනු වෙනුවෙන් පුලුල් ලෙස අපචාරයේ යොදවන, පවත්නා සීමිත පහසුකම්, සියලු ම දෙනා සඳහා ප්‍රමානවත් ආදායමක් සහතික කරන, පොදු සුබසාධක හා විශ්‍රාම ක්‍රමයකින් විස්ථාපනය කල යුතු ය.

### ❍ සියලු පවුල්වලට යහපත් නිවාස

බොහෝ පවුල් දිවි ගෙවන්නේ. නල ජලය, විදුලිය හා නිසි වැසිකිලි පහසුකම් වැනි මූලික පහසුකම්වලින් තොර ඉතා බාල ප්‍රමිතියේ නිවාසවල ය. අති මහත් ජනතාවකට යහපත් නිවාස පහසුකමක් ලබා ගත නො හැකි මට්ටමකට, ගෙවල් කුලී ඉහල නැග තිබේ. කොලඹ නගරය තුල ජනගහනයෙන් සියයට 51ක් ජීවත් වන්නේ පැල්පත්වල ය. ආන්ඩුව මීට දෙන පිලිතුර නම්, දුප්පත් ජනයා මුඩුක්කුවලින් පලවා හැර එම ඉඩම් මහ ව්‍යාපාරිකයන්ට ලබා දීමයි.

සැම පවුලකට ම දැරිය හැකි මිලකට යහපත් නිවාස පහසුකම් සපයනු පිනිස, සියලු අත්‍යවශ්‍ය පහසුකම්වලින් යුක්ත පොදු නිවාස ඉදි කල යුතු යයි සසප කියා සිටී. ගෙවල් කුලී පාලන ක්‍රමයක් ඇති කොට, එය මනාව අධීක්ෂනය කරමින්, වංචාකාර නිවාස හිමියන්ගේ අධික ලාභ ගැරීම් වලකාලිය යුතු ය. හිස්ව තිබෙන නිවාස හා තට්ටු ගෙවල් නාමික කුලියකට දුගී පවුල්වලට ලබා දිය යුතු ය.

### ❍ කුඩා ගොවීන්ගේ දරිද්‍රතාව අහෝසි කරනු

ඉඩම්වල අවශ්‍යතාව රට පුරාම වඩවඩාත් උග්‍ර වී තිබේ. නිල සංඛ්‍යා ලේඛනවලට අනුව, ගොවීන්ගෙන් අති මහත් බහුතරයකට, එනම් සියයට 72කට, ඇත්තේ ඉඩම් හෙක්ටෙයාර් 1.6කට අඩු ප්‍රමානයකි. සත්තකින් ම, සියයට 7කට ආසන්න ප්‍රමානයකට ඉඩම් ඇත්තේ ම නැත.

එජාප හා පොදු පෙරමුන යන දෙපාර්ශ්වය ම, ඉඩම් අහිමි සිංහල දුප්පත් ජනයා මුහුන දෙන අර්බුදය ගසාකමින්. සිතාමතාම, දෙමල ජනයා බහුතරයක් වාසය කරන, උතුරේ වන්නි ප්‍රදේශයේ හා නැගෙනහිර පලාතේ ජනපද තුල ඔවුන් පදිංචි කරවා ඇත. එම පිලිවෙත තුඩු දී ඇත්තේ වාර්ගික ආතතීන් තව දුරටත් උග්‍ර කිරීමට ය. නිෂ්පාදන වියදම් ඉහල නගින නමුත් කෘෂි නිෂ්පාදිතවල මිල ගනන් දිගටම පහල වැටෙන තතු යටතේ, සැම තැනකම දුගී ගොවීහු "කතුරුතල අර්බුදයකට" හසුව සිටිති.

ඉඩම් නැති සියලු ගොවීන්ට, ඔවුන්ගේ ජනවාර්ගිකත්වය නො තකා, රාජ්‍ය ඉඩම් ලබා දිය යුතු යයි සසප කියා සිටී. දුගී ගොවීන්ගේ හා ධීවරයන්ගේ සියලු අතීත නය කපා හැරිය යුතු අතර, බැංකු නය, කෘෂි උපකරන, පොහොර හා රසායන ද ධීවර ආම්පන්න ද පහසු කොන්දේසි යටතේ ලබා දිය යුතු ය. පොහොර වැනි කෘෂි අමුද්‍රව්‍යවලට දෙන සහනාධාර පුනස්ථාපනය කොට ඉහල දැමිය යුතු ය. ගොවි පවුල්වලට යහපත් ජීවන මට්ටමක් සහතික කරලනු පිනිස කෘෂි නිෂ්පාදනවලට සහතික මිලක් ලබා දිය යුතු ය.

## සමාජවාදය සහ ශ්‍රී ලංකාවේ කම්කරු පන්තිය

සමාජවාදී සමානතා පක්ෂය, අද හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව තුල සංරක්ෂිතව පවතින, ජාත්‍යන්තර සමාජවාදී ව්‍යාපාරයේ ශ්‍රේෂ්ඨ සම්ප්‍රදායන් මත — එනම්, සමානතාව, ජාත්‍යන්තරවාදය සහ මනුෂ්‍ය වර්ගයා පීඩනයෙන් හා නැතිබැරිකමින් ද්‍රව්‍යමයව හා අධ්‍යාත්මකව විමුක්ත කරගැනීම මත — පාදක වේ.

1917 දී, විද්‍යාත්මක සමාජවාදයේ ක්‍රියාමාර්ගය මගින් මෙහෙයවුනු රුසියාවේ මහජන ව්‍යාපාරයක්, ධනවාදය පෙරලා දමා සෝවියට් සංගමය ස්ථාපිත කලේ ය. රුසියානු විප්ලවය, වඩා පුලුල් ජාත්‍යන්තර සමාජවාදී ව්‍යාපාරයක කොටසක් වෙමින් ම, එවන් ව්‍යාපාරයක නැගීම දිරිමත් කලත්, අනෙක් තැන්වල විප්ලවවාදී අරගලයන් පරාජයට පත්වීම මගින්, අතිමහත් පීඩනයන් නිර්මානය කෙරුනි. ප්‍රථම කම්කරු රාජ්‍යය හුදකලා වීම සහ ජෝශප් ස්ටාලින්ගේ නායකත්වයෙන් යුත් මර්දනකාරී, නිලධරවාදී යන්ත්‍රනයක මතුවීම තුලින්, එය, ප්‍රකාශයට පත් විය. බෝල්ෂේවික් පක්ෂයේ ජාත්‍යන්තරවාදය අතහැර දැමූ ස්ටාලින්, "තනි රටක සමාජවාදය ගොඩනැගීම" පිලිබඳ මාක්ස්වාද-විරෝධී ඉදිරිදර්ශනය ඉදිරිපත් කලේ ය. මෙම ජාතිකවාදී සංකල්පයේ පදනම මත, ස්ටැලින්වාදී නිලධරය, ඔක්තෝබර් විප්ලවය පාවාදී, කම්කරු ප්‍රජාතන්ත්‍රවාදය විනාශ කොට, සැබෑ මාක්ස්වාදීන් විරේක කොට දමා, ලෝකය පුරා කම්කරු පන්තියේ විප්ලවවාදී අරගල කඩාකප්පල් කලේ ය. 1991 වන විට, ස්ටැලින්වාදයේ සහ අධිරාජ්‍යවාදය සමග එය පවත්වාගෙන ආ සහයෝගිතාවයේ ප්‍රතිගාමී තර්කනය, සෝවියට් සංගමය බිඳදැමීම සහ ධනවාදය පුනස්ථාපනය කිරීම ලෙස කූඨප්‍රාප්තියට පත්විය.

අපගේ ව්‍යාපාරය, සමාජවාදී ජාත්‍යන්තරවාදය

සඳහා අරගලය ඉදිරියට ගෙනගිය, කම්කරු පන්තියේ හොඳම, වඩාත්ම ධෛර්ය සම්පන්න හා දූරදර්ශී නියෝජිතයන්ගේ උරුමය මත පදනම් වේ. මෙම සම්ප්‍රදායේ ශ්‍රේෂ්ඨතම දේහානුරූපය වූයේ, ස්ටැලින්වාදයේ පාවාදීම්වලට එරෙහි සටනට නායකත්වය දී, 1938 දී හතර වන ජාත්‍යන්තරය පිහිටුවීම මගින් ජාත්‍යන්තර කම්කරු ව්‍යාපාරයේ පුනර්ජීවනය සඳහා පදනම දැමූ, රුසියානු විප්ලවයේ නායකයකු වූ ලියොන් ට්‍රොට්ස්කි ය.

මෙම ඓතිහාසික අරගල, ශ්‍රී ලංකාවේ හා දකුනු ආසියාවේ කම්කරු පන්තිය තුල ගැඹුරටම මුල් බැසගත්තේ ය. 1940 ගනන්වල දී, ශ්‍රී ලංකාවේ ට්‍රොට්ස්කිවාදියෝ, ස්ටැලින්වාදයට එරෙහිව ට්‍රොට්ස්කි ගෙනගිය දේශපාලන අරගලය මත පදනම්ව, ඉන්දියානු උප-මහාද්වීපයේ කම්කරු පන්තිය හා පීඩිත ජනතාව සඳහා ප්‍රජාතාන්ත්‍රික හා සමාජවාදී ඉදිරිදර්ශනයක් වර්ධනය කරනු පිනිස, ට්‍රොට්ස්කිගේ නොනවතින විප්ලව න්‍යායේ මූලධර්ම යොදාගනිමින්, ඉන්දියානු බෝල්ෂේවික් ලෙනින්වාදී පක්ෂය (බීඑල්පීඅයි) පිහිටුවීමෙහි ලා ප්‍රධාන කාර්යභාරයක් ඉටු කලහ. යුද්ධයෙන් අනතුරුව, ට්‍රොට්ස්කිවාදියෝ, මෙම ඉදිරිදර්ශනය මත පදනම්ව, කොලඹ දේශීය ධනපති පන්තියට ලන්ඩනය විසින් ප්‍රදානය කරන ලද ව්‍යාජ “ස්වාධීනත්වය” ප්‍රතික්ෂේප කල අතර, ජාතිවාදී රේඛා ඔස්සේ ඉන්දියානු උප-මහාද්වීපය බෙදීමේ ව්‍යසනකාරි පිලිවෙතට ද එරෙහි වූහ.

1940 ගනන් හා 1950 ගනන්වල ශ්‍රී ලංකාවේ කම්කරු පන්තිය විසින් දිනා ගන්නා ලද සියලු ජයග්‍රහනයන්ට කේන්ද්‍රීය වූයේ, කම්කරු පන්තියේ ජාත්‍යන්තර එකමුතුව සඳහා බීඑල්පීඅයි සහ ලසසප ගෙනගිය දේශපාලන අරගලය සහ සියලු ම ආකාරයේ වර්ගවාදයන්ට හා ස්වෝත්තමවාදයන්ට ඔවුන් දැක්වූ අධිෂ්ඨානවත් විරුද්ධත්වයයි. ලසසප, ශ්‍රී ලංකාවේ පීඩිත ජනතාව ද ලෝකය පුරා, විශේෂයෙන් ම ආසියාවේ, කම්කරුවන් ද හමුවේ ප්‍රදීපස්ථම්භයක් බවට පත් විය. අද ශ්‍රී ලංකාවේ කම්කරු පන්තියට මුහුන දීමට සිදුව ඇති ගැටලු, ලසසප, ජාත්‍යන්තරවාදයෙන් නිෂ්ක්‍රමනය වීමත් දේශීය ධනේශ්වරයේ වර්ගවාදී දේශපාලනයට එහි අනුගතවීම, 1964 දී එය සිදු කල පාවාදීමෙන් කූලුගැන්වීමත්, සමග සෘජුවම සම්බන්ධ වේ.

සසපයේ පූර්වගාමියා වූ විප්ලවවාදී කොමියුනිස්ට සංගමය (විකොස), 1968 දී පිහිටුවන ලද්දේ, ලසසපය ජාතික අවස්ථාවාදයට පල්ලම් බැසීමට එරෙහි සෘජු දේශපාලන අරගලයක් තුලින්, හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ශ්‍රී ලංකා ශාඛාව ලෙස ය. පසුගිය දශක තුනහමාරක කාලය මුලුල්ලේ, විකොස සහ සසප, සියලුම ආකාරයේ ස්වෝත්තමවාදයන්ට, වෙනස්කම් කිරීම්වලට හා පීඩනයන්ට ක්ෂමා විරහිතව විරුද්ධ වී, කම්කරු පන්තියේ හා ගම්බද දුගී ජනයාගේ ප්‍රජාතන්ත්‍ර අයිතීන් වෙනුවෙන් පෙරමුන ගෙන සටන් වැදී ඇති අතරම, ජාතිකවාදී දේශපාලනයේ සියලු ම රූපාකාරයන් මගින් මතු කෙරෙන අන්තරායන් න්‍යායිකව පැහැදිලි කිරීමේ ප්‍රයත්නයක යෙදී තිබේ.

ශ්‍රී ලංකාවේ හා කලාපයේ කම්කරු පන්තිය මුහුන දී සිටින අභියෝගය නම්, බීඑල්පීඅයිහි හා ලසසපයේ අතීත අරගලයන් මගින් ප්‍රානවත් කෙරුනු, ශ්‍රේෂ්ඨ සමාජවාදී සම්ප්‍රදායන් සහ අදහස් පුනර්ජීවනය හා වර්ධනය කිරීමයි. එම කර්තව්‍යයට කේන්ද්‍රීය වන්නේ, ඉන්දියාවේ හා ශ්‍රී ලංකාවේ තීරනාත්මක අරගල ද ඇතුලු, විසි වන සියවස පුරා ජාත්‍යන්තර කම්කරු පන්තිය ලද මූලෝපායික අත්දැකීම්වල පාඩම් උකහා ගැනීමයි.

සැබෑ සාමයේත් සමාජය සමාජවාදී පිලිවෙත් ඔස්සේ පරිවර්තනය කිරීමේත් දැවෙන අවශ්‍යතාව හඳුනාගත් සියල්ලන්ගෙන් ම අප ඉල්ලා සිටින්නේ, අපගේ මැතිවරන උද්ඝෝෂනයට ක්‍රියාශීලීව සහයෝගය දෙන ලෙසයි. එයින් අදහස් කෙරෙන්නේ, අපගේ අපේක්ෂකයන් හා රැස්වීම් ප්‍රසිද්ධ කිරීමට සහාය දීම, අපගේ මැතිවරන ප්‍රකාශන බෙදාහැරීම හා ඒවා සාකච්ඡා කිරීම සහ හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ අන්තර්ජාල කේන්ද්‍රය වන *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* සඳහා හැකි තරම් පුලුල් ශ්‍රාවකත්වයක් දිරිගැන්වීමයි.

අන් සියල්ලටමත් වඩා, අපගේ ක්‍රියාමාර්ගය හා ඉදිරිදර්ශනය සමග එකඟ වන සැමගෙන් අප ඉල්ලා සිටින්නේ, සමාජවාදී සමානතා පක්ෂයට එක්වී, කම්කරු පන්තියේ නව දේශපාලන පක්ෂය ලෙස එය ගොඩනැගීමට සටන් වදින ලෙසයි.

© www.wsws.org